# කන්ද උඩරට සිට...



සිසිලැති දුරුතු සුළඟින් ගත සිත පිබිදෙයි
පිපි මල් පොකුරු පිසීමින් සුවඳක් පැතිරෙයි
නව පරිසරයකට යළි හදවත බරවෙයි
විසි වසරකට පෙර දිවියක් සිත නැංවෙයි

සුවිසල් මැදුරු හා පැල්පත් පසු කරමින්
අමිහිරි කටුක වුව ඉන් සොම්නස ලබමින්
වසරක අගනුවර දිවියද පසු කරමින්
යළි පිය නගමි කඳුරට සිරි සුව විඳිමින්

ලොව පුබුදා සත සනසා සැවොම තැන
පෑ දිනිදා රැස් විහිදා නැගෙනු මෙන
දුක හැරදා මන පුබුදා වඩන ගුණ
සිරි දළදා හිමි හැමදා පුදනු මැන

එදවස වීර හෙළ දරුවෙක් වී ඉපිද
රටදැය නිසා තම ජීවය පුදන ලද
බෝගම්බර වැවේ මදනල පහස ලද
මද්දුම බණ්ඩාර රුව සනසවයි හද

සුදුමුදු කැකුළු ලා හිරු රැස් හා පිබිදෙයි
මළහිරු සමඟ පරවී පෙති බිම ගිලිහෙයි
අබියස දෙයට නිවහල් සිත ගත නොසැලෙයි
දෑ නංවන පැතුම දෙලොවට වැඩ සලසයි

එදවස කඳුරටේ දියුණුව ගැන සිතමූ
—යළි ඒ වන් දවසක් දකුමට පතමූ
පලබර ගහ කොළෙන් පිරි කෙත් වතු දකිමූ
හෙළ ජාතියේ නව යුගයක් බිහි කරමූ

කෘෂිකර්ම නිලධාරි ශාස්ත්‍ර විශාරද
ඩී. ඇස්. හපුකන්තිරි.